## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

# දේශීය නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය - වර්ෂ 2024/2025

## අයදුම්පත් කැඳවීම

### පොදු තොරතුරු, උපදෙස්, නීති රීති හා මාර්ගෝපදේශ

**පොදු තොරතුරු**

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත මගින් පිහිටුවා ඇති විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි.

01) ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පිහිටුවීමේ අරමුණ අනුව යමින් ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ට සිය නව නිපැයුම් සඳහා අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය හා නීති ආධාර ලබා දෙමින් එම නව නිපැයුම් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා දිරි ගැන්වීම සිදු කරනු ලබයි.

මෙම අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් කොමිසම විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම ද ඒ අතරින් ප්‍රමුඛත්වය ගත් වැඩසටහනකි.

02) ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 11(ඊ) පරිච්ඡේදයේ සඳහන් පරිදි ශ්‍රී ලංකාවේ දී පේටන්ට් ලබා ඇති ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් වෙනුවෙන් මෙම තරඟය විවෘත වේ.

03) තරඟය සඳහා අදාල තාක්ෂණික ක්ෂේත්‍රයන් යටතේ, ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් හට පුද්ගල, කණ්ඩායම් හෝ ආයතන වශයෙන් සිය නව නිපැයුම් මෙම ජනාධිපති සම්මාන තරඟය සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව හිමිවන අතර, අයදුම්පත් කැඳවන වර්ෂයෙහි ජනවාරි පළමුවන දින සිට දෙසැම්බර් 31 දක්වා දේශීය පේටන්ට් බලපත්‍ර ලබාගත් ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් මෙසේ ඒ ඒ වර්ෂයන් හි ජනාධිපති සම්මාන තරඟය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබනවා ඇත.

04) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති වෙතින් පත් කරන ලද විනිශ්චය මණ්ඩලයක් විසින් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ගේ නව නිපැයුම් ජනාධිපති සම්මාන ලබාදීම සඳහා විනිශ්චයට ලක් කරනු ලැබේ. විනිශ්චය මණ්ඩලය විසින් එක් එක් තාක්ෂණික ක්ෂේත්‍රයට අදාලව හොඳම නව නිපැයුම (හෝ ක්ෂේත්‍රය තුල සම ලකුණු ලබා ඇති විටෙක එම අදාල නව නිපැයුම්) තෝරා ගනු ලබන අතර, ඒ සඳහා සහතික පත්‍රයක් හෝ සහතික පත්‍රයක් සමඟ මුදල් ත්‍යාගයක් හෝ කාලීන රාජ්‍ය තීරණ හා උපදෙස් අනුව හිමි වේ. එම ක්ෂේත්‍රගත හොඳම නව නිපැයුම් අතරින් තෝරා ගැනෙන ඉහළතම විභවය සහිත නව නිපැයුම සඳහා අදාල වර්ෂයේ විශිෂ්ටතම නව නිපැයුමට හිමි ජනාධිපති සම්මානය පිරිනමනු ලබයි. නව නිපැයුම් ඇගයීම් අවස්ථාවේ සිට වසරේ විශිෂ්ටතම නව නිපැයුම තෝරාගැනීම දක්වා වූ අවස්ථාව තෙක් නව නිපැයුමක් අදාල සුදුසුකම් සපුරා නොමැති විටෙක දී ඉහත කී ජයග්‍රහණ ප්‍රදානය කරනු නොලැබේ.

**පොදු උපදෙස්, නීති රීති සහ මාර්ගෝපදේශ**

1) ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් 2024 හා 2025 වර්ෂයන්ට අදාලව නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ පේටන්ට් බලපත්‍රයක් හිමි සියළුම ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් සඳහා මෙම තරඟය විවෘත ය.

2) අයදුම්කරුවන් ජනාධිපති සම්මාන තරඟය සඳහා නිකුත් කරනු ලබන මෙම පොදු උපදෙස්, නීති රීති, කොන්දේසි හා මාර්ගෝපදේශ පත්‍රිකාව ඉතා හොඳින් කියවා තේරුම් ගෙන මෙම වැඩසටහන තුල දී ඒවායින් බැඳීමට එකඟ විය යුතු ය.

3) සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ හොඳින් කියවා බලා, තරඟය සඳහා සුදුසුකම් සහිත නව නිපැයුම්කරුවන් පමණක් ඊට අදාල අයදුම්පත්‍රය භාවිතා කරමින්, තමන් විසින්ම අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

4) අයදුම්කරුවන්ට තනි පුද්ගල හෝ කණ්ඩායම් වශයෙන් මෙන්ම ආයතන නියෝජනය කරන්නේ නම් එහිදී ද තනි පුද්ගල හෝ කණ්ඩායම් වශයෙන් තරඟයට ඇතුල් වීම සඳහා අයදුම් කළ හැකි ය.

5) පේටන්ට් බලපත්‍රය නව නිපැයුම්කරුවන් කණ්ඩායමක් සඳහා ප්‍රදානය කර ඇත්නම්, පේටන්ට් ලේඛනයේ <u>නව නිපැයුම්කරුවන්ගේ විස්තර සඳහන් කොටසේ පළමුවෙන් සඳහන් නව නිපැයුම්කරු හෝ එහි සඳහන් ඕනෑම නව නිපැයුම්කරුවෙකුට අයදුම්පත අත්සන් කළ හැකිය. එහිදී අනෙකුත් නව නිපැයුම්කරුවන්ගේ නම් සහ අදාළ විස්තර අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය.</u>

6) එක් නිපැයුමක් සඳහා ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. කණ්ඩායම් නිපැයුමක් වන අවස්ථාවකදී, කණ්ඩායමේ එක් සාමාජිකයෙකු විසින් පමණක් අයදුම්පත ඉදිරිපත් කළ යුතු අතර, අනෙකුත් සියලුම කණ්ඩායම් සාමාජිකයන්ගේ නම් හා අදාළ විස්තර සඳහන් කර, මෙම අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා ඔවුන්ගේ එකඟතාවය සනාථ කිරීම පිණිස ඔවුන්ගේ අත්සන් ද අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

7) නියමිත වර්ෂයට අදාලව එක් නව නිපැයුමකට වඩා වැඩි නව නිපැයුම් සංඛ්‍යාවක් ඉදිරිපත් කරනු ලබන නව නිපැයුම්කරුවන් ඒ එක් එක් නව නිපැයුම සඳහා වෙන වෙනම අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු වේ.

8) අයදුම්කරුවන් තම නව නිපැයුම් සංකල්පය ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා අවම වශයෙන් නව නිපැයුමේ මූලාදර්ශය හෝ ක්‍රියාත්මක ආකෘතියක් ඉදිරිපත් කළ යුතු වේ. එසේ මූලාදර්ශය හෝ ක්‍රියාත්මක ආකෘතියක් ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවන්හි දී නව නිපැයුමට අදාළ රූප සටහන් ඇතුලත් විස්තරාත්මක වාර්තාවක් හෝ වීඩියෝ දර්ශන/ඡායාරූප විනිශ්චය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

9) නව නිපැයුම පිළිබඳ විස්තර අඩංගු ඡායාරූප/රූපසටහන් ඇතුලත් පැහැදිලි විස්තරයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කිරීමට නව නිපැයුම්කරු වග බලා ගත යුතු වේ.

පහත දක්වා ඇති කරුණු ඇතුලත්ව එම විස්තරය සකස් විය යුතු වේ.

a) නව නිපැයුම පිළිබඳ අදහස හා එය දියුණු කිරීමට හේතු වූ කරුණු
b) නව නිපැයුම ක්‍රියාත්මක කරන ආකාරය
c) ප්‍රායෝගික යෙදවීම/ප්‍රයෝජනවත් භාවය
d) නව නිපැයුමේ අවසාන නිමැවුම නිපදවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය (දේශීය හෝ විදේශීය වෙළෙඳ පොළෙන් ලබා ගන්නා)
e) නිෂ්පාදිත පිරිවැය
f) නව නිපැයුමේ වානිජ විභවය, වෙළෙඳපොළ ඉල්ලුම.. යනාදී
g) නව නිපැයුම සඳහා පාදක කර ගත් ප්‍රමේයයන්/මූලධර්ම*

* *නව නිපැයුම දියුණු කිරීමේ දී නව ප්‍රමේයයන්/මූලධර්ම අයදුම්කරු විසින් හඳුන්වා දෙන්නේ නම්, එම ප්‍රමේයයන් භාවිතයේ ප්‍රායෝගික බව විනිශ්චය මණ්ඩලය ඉදිරියේ තහවුරු කිරීමට අයදුම්කරු සමත් විය යුතු ය. එසේ නොමැති නම් එම ප්‍රමේයයන් හි ප්‍රායෝගික බව තහවුරු වී ඇති බවට පිළිගත් ආයතනයකින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ.*

*එසේම අයදුම්කරුගේ නව නිපැයුම වෛද්‍ය නිෂ්පාදනයක් නම් (දේශීය හෝ බටහිර) එම නිෂ්පාදන වල සාර්ථකත්වය සායනිකව තහවුරු කළ යුතු වේ. එසේ නොමැති නම්, එය මානව ප්‍රජාව සඳහා සාර්ථකව භාවිතා කළ හැකි බවට තහවුරු කරමින්, පිළිගත් වෛද්‍ය ආයතනයකින් ප්‍රමාණවත්, සනාථ කළ හැකි දත්ත ඇතුලත් සහතික පත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ.*

**සැ.යු :-**

- **අයදුම්පත සමඟ කිසිදු ලියකියවිල්ලක මුල් පිටපත් අමුණා නොඑවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේ දී විනිශ්චය මණ්ඩලය වෙත එම මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.**

- **නව නිපැයුම හා අදාල සියළුම තොරතුරු, ලිපිලේඛන යනාදිය විනිශ්චය පැවැත්වෙන දිනයේදී ම එම විනිශ්චය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉන් අනතුරුව ලබාදෙන තොරතුරු කිසිවක් විනිශ්චය සඳහා අදාල කර නොගැනේ.**

10) **එක් එක් වර්ෂයට අදාලව ජනාධිපති සම්මාන තරඟය සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් එම අදාල වර්ෂයේ ජනවාරි 01 වන දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුලදී ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාලයෙන් නිකුත් කරන ලද පේටන්ට් බලපත්‍රයක් ලබා තිබිය යුතු වේ.**

11) තරඟයට ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී බුද්ධිමය දේපළ ආරක්ෂාව ලබා තිබුණ ද මෙම නව නිපැයුම් හි තාක්ෂණයන් වෙනත් පාර්ශ්වයකට නිරාවරණය වීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වගකීමෙන් බැහැර වේ.

12) නිවැරදිව පුරවා අත්සන් කිරීමෙන්, තරඟයේ නීතිරීති හා කොන්දේසි වලට බැඳුනු තරඟකරුවන් තම අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කාර්යාලය වෙත **<u>ලියාපදිංචි තැපෑලෙන්</u>** එවිය යුතු වේ.

<u>**අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026 අගෝස්තු 31 දින**</u> <u>වේ</u>. මෙම දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13) ආයතනයක නමට බුද්ධිමය දේපළ කාර්යාලය විසින් පේටන්ට් බලපත්‍රයක් නිකුත් කර ඇති අවස්ථාවක දී, ජනාධිපති සම්මාන තරඟය සඳහා අයදුම් කර ඇත්තේ නව නිපැයුම්කරු නම්, එම අයදුම්කරුගේ නම පේටන්ට් බලපත්‍රයේ නව නිපැයුම්කරුගේ නම සඳහන් ස්ථානයේ සඳහන් ව තිබිය යුතු වේ. එවැනි අවස්ථාවක දී එම නව නිපැයුම ජයග්‍රහණයක් හිමි කර ගත්තේ නම්, එම ජයග්‍රහණයට අදාල සහතික, කුසලාන සහ ත්‍යාග මුදල් **<u>නව නිපැයුම්කරුගේ නමට නිකුත් කරනු ලැබේ</u>**.

14) ජනාධිපති සම්මාන තරඟය සඳහා නව නිපැයුම් ඇගයීමේ ක්‍රියාවලියේ අවසන් තීරණය විනිශ්චය මණ්ඩලය සතු වන අතර අනෙකුත් සියළු ගැටළු සම්බන්ධයෙන් අවසන් තීරණය කොමිසම සතු වේ.

15) තරඟයට ඇතුලත් වීම සඳහා අයදුම්පත් එවිය හැකි තාක්ෂණික ක්ෂේත්‍ර පහත දක්වා ඇත.

1. මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
2. රසායන විද්‍යාව
3. ආහාර තාක්ෂණය
4. වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
5. සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
6. පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
7. භෞතික විද්‍යාව
8. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
9. කෘෂිකර්මය
10. ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ
11. බලශක්තිය
12. පරිසර සංරක්ෂණය
13. ප්‍රවාහන
14. ඉංජිනේරු

ඉහත තාක්ෂණික ක්ෂේත්‍රයන්, තරඟයේ විධිමත් මෙහෙයුම් අවශ්‍යතා ඇතුළුව වාණිජකරණ ප්‍රභවයන් සහිත විශේෂිත නව නිපැයුම් තෝරාගැනීම සඳහා භාවිතා කෙරේ.

16) තරඟකරුවන් විසින් තරඟයට පෙර හෝ පසු තරඟ විනිශ්චයන් සම්බන්ධයෙන් විනිශ්චය මණ්ඩලය සමඟ සම්බන්ධ වීමට හෝ විනිශ්චය කටයුතු සම්බන්ධයෙන් ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් මෙන්ම ඒ වෙනුවෙන් ගනු ලබන ඕනෑම උත්සාහයක් තරඟයට නුසුදුස්සෙකු සේ සලකා අදාල තරඟයෙන් ඉවත් කිරීමට දැඩිව හේතු වේ.

## සාමාන්‍ය කරුණු

නව නිපැයුමට අදාල පසුබිම් විස්තර සියල්ල අනුපිළිවෙලට ලියා තබා ගැනීම තුළින් ඔබට යම් කිසි වැදගත් කරුණක් අතපසු නොවනු ඇත. ඔබ ලඟ යම් ලිඛිත සාක්ෂි වේ නම් ඒවා පැහැදිලිව සටහන් කරගෙන රැගෙන ඒමෙන් වඩා ක්‍රමානුකූලව හා නිවැරදිව විනිශ්චය මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමට එය රුකුලක් වනු ඇත.

සමහර අවස්ථාවල දී විනිශ්චය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න අසාධාරණ සහ දැඩි බැව් ඔබට හැඟෙනු ඇත. එහෙත් එම ප්‍රශ්න ඔබ විසින් ඔවුනට පැහැදිලි කළ යුතු යැයි ඔවුන් අපේක්ෂා කරන ප්‍රශ්න වේ. එසේ වන්නේ තරඟය සම්බන්ධයෙන් ඔවුනට වඩාත් නිවැරදි තීරණයක් ගැනීමට අවශ්‍ය වන බැවිණි.

සම්මුඛ පරීක්ෂණය සඳහා ලබා දී ඇති වේලාවට අවම වශයෙන් මිනිත්තු 10කට ප්‍රථම අදාල ස්ථානය වෙත පැමිණ සිටීම අවශ්‍ය වේ. නව නිපැයුමේ ක්‍රියාකාරීත්වය ඇතුලත් වීඩියෝපට හෝ නව නිපැයුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරගැනීම සඳහා මෙම කාලය ඔබට උපකාරී වනු ඇත.

එක් එක් තාක්ෂණික ක්ෂේත්‍රයන් හි විශේෂිත ජයග්‍රහණ තෝරාගැනීමේ දී නව නිර්මාණයේ වාණිජකරණ පසුබිම හෝ සමාජයීය යහපත උදෙසා භාවිතයට යොදාගැනීම පදනම් කරගත් නව නිපැයුම් සඳහා ප්‍රමුඛතාවය දීමට කටයුතු කරනු ඇත. එය තහවුරු කිරීම සඳහා විධිමත් ලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ.

**තව ද විනිශ්චය කිරීම හා අදාල කටයුතු සම්බන්ධයෙන් යම් ගැටළුවක් වේ නම් එම අවස්ථාවේදීම ඒ පිළිබඳව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ නිලධාරීන් වෙත දැනුම් දිය යුතු අතර, ඉන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි පිළිබඳව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම කිසිදු ආකාරයකින් මැදිහත් නොවන බවට අවබෝධයෙන් කටයුතු කළ යුතු ය.**

## විශේෂ කරුණු

උක්ත කරුණු පිළිබඳව තරඟකරුවකු ලෙස ඔබ දක්වන නොසැලකිල්ල, අනවබෝධය හෝ වැරදි අවබෝධය මෙන්ම යම් කාර්යයක් ඉටු කිරීමට ඔබ ගේ අපොහොසත් වීම මත විනිශ්චය මණ්ඩලය හෝ කොමිසම වෙතින් ලැබෙන අවසන් තරඟ තීරණයන් හෝ තරඟයෙන් ඉවත් කිරීමට සිදුවීම් හේතුවෙන් ඇති වන සියලුම අපහසුතාවයන් පිළිබඳව කොමිසම කිසිදු ලෙසකින් හෝ වග කියනු නොලබන අතර, තරඟකරුවන් විසින් එම තත්ත්වය විඳදරා ගත යුතු ය.

- ✶ *විනිශ්චය මණ්ඩලය යනු දේශීය නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීමේ තරඟාවලියේ විනිශ්චය ක්‍රියාවලියෙහි නිරත වන සියලුම සාමාජිකයන්ගෙන් සමන්විත මණ්ඩලය වේ. මෙම විනිශ්චය ක්‍රියාවලිය නව නිපැයුම් සම්බන්ධයෙන් මෙන්ම එම නව නිපැයුම් වාණිජකරණය කිරීම, පරීක්ෂා කිරීම, තහවුරු කර ගැනීම සහ ඒවාට අදාළ අනෙකුත් සියලු ක්‍රියාදාමයන් පිළිබඳව ඇගයීම සහ තීරණ ගැනීමේ අරමුණින් සිදු කරනු ලැබේ.*

## ප්‍රධාන වචන වල අර්ථ දැක්වීම්

a) නව නිපැයුම - නව නිපැයුමක් යනු අනන්‍ය වූ නවතම උපකරණයක්, ක්‍රමවේදයක්, සංයෝගයක් හෝ ක්‍රියාවලියකි. නව නිපැයුම් ක්‍රියාවලිය, සර්ව සම්පූර්ණයෙන්ම ඉංජිනේරු සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම ඇතුලත් ක්‍රියාවලියකි. එය යන්ත්‍රයක් හෝ නිෂ්පාදනයක් මත සිදුකරනු ලබන වැඩිදියුණු කිරීමක් හෝ යම් වස්තුවක් හෝ ප්‍රතිඵලයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් විය හැකි ය. සර්ව සම්පූර්ණයෙන්ම අනන්‍ය වූ කාර්යයක් හෝ ඵලයක් ළඟා කරන නව නිපැයුම්, පවත්නා තාක්ෂණයන් හි අත්‍යන්ත වෙනසක් සිදුකරනු ඇත.

b) නව ප්‍රවර්ධීකරණය - පවත්නා නව නිපැයුමක් වැඩිදියුණු කරමින් වෙළෙඳ පොළට උචිත තත්ත්වයකට සකසන ලද භාණ්ඩයක් නව ප්‍රවර්ධීකරණයකි. එය ද නව නිපැයුමක මූලික අංග වන නව නිපැයුම්කාරී පියවර, කාර්මිකව යොදා ගැනීමට හැකි වීම සහ මිනිසාට ප්‍රයෝජනවත් භාවයෙන් යුක්ත වූ නිෂ්පාදනයකි.

c) මූලාදර්ශය - නව නිපැයුම් සංකල්පය භෞතිකව ඉදිරිපත් කිරීම සඳහා ප්‍රථමයෙන්ම ගොඩනඟන ලද පූර්ණ පරිමාණයෙන් යුක්ත ක්‍රියාකාරී සැකසුම, මූලාදර්ශයක් වශයෙන් හැඳින්වේ. නව නිපැයුමක ප්‍රථම නිෂ්පාදනය මෙය වේ.

d) ක්‍රියාකාරී ආකෘතිය - හුදෙක්ම නව නිපැයුමක ක්‍රියාවලිය ආදර්ශනය කර පෙන්වීම සඳහා එහි සත්‍ය ප්‍රමාණයට වඩා කුඩා පරිමාණයෙන් සකසන ලද ආකෘතියක් වශයෙන් ක්‍රියාකාරී ආකෘතිය හැඳින්විය හැකි ය.

e) පේටන්ට් බලපත්‍රය - නව නිපැයුමක් අන් අයකු මගින් නිෂ්පාදනය කිරීම, භාවිතා කිරීම හෝ විකිණීම වළකමින් එහි හිමිකරුට පමණක් එම අයිතිය නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා පවරමින් රජය විසින් ලබාදෙන නීතිමය ලියවිල්ලකි.

❖ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට එවිය යුතු වන අතර, ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි **"නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන - ....."** *(හිස්තැනෙහි අදාල වර්ෂය සටහන් කළ යුතු ය)* යනුවෙන් සඳහන් කිරීම අවශ්‍ය වේ.

අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
05 වන මහළ, "මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල,
නාරාහේන්පිට,
කොළඹ 05.

දුරකථන අංකය : 011-2676649
ඊ මේල් : presidentialawards.slic@gmail.com    වෙබ් : www.slic.gov.lk